**චීන සංවර්ධන බැංකු අරමුදල් මඟින් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 –(අදියර I) - 2014**

-----------------------------------------------------------------------------------------

චීන සංවර්ධන බැංකු අරමුදල් මඟින් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 –(අදියර I) හි 2014 සැප්තැම්බර් 09 සිට 2014 දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන සංවර්ධන බැංකු සහයෝගීතාවය අතර 2014 මාර්තු 11 දින එළඹි අංක 4510201401100000245 දරන ණය පහසුකම් ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රට පුරා විහිදී ඇති මාර්ග කොටස් ප්‍රමුඛතා මත තෝරාගෙන ප්‍රතිසංස්කරණය කිරීම මඟින් වැදගත් අත්‍යාවශ්‍ය සේවාවලට ප්‍රවේශවීම පහසුකිරීම සහ ආර්ථික සංවර්ධන කටයුතුවලට දායක වීමෙන් රටෙහි ජාතික මහාමාර්ග පද්ධතියේ ගමනාගමනය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුම අනුව ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 46,184.54 කට සමාන එ.ජ.ඩො. මිලියන 357.68 ක් වූ අතර එයින් රු. මිලියන 38,736 කට සමාන එ.ජ.ඩො. මිලියන 300 ක් චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 09 ආරම්භ කළ අතර 2017 ජූලි 17 වනවිට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම්

තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු. මිලියන 11,172 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වල අගය රු. මිලියන 3,319 කින් වැඩිපුර දක්වා තිබීම හේතුවෙන් මාර්ග 07 ක ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් සඳහා 2015 වර්ෂයේදී ගෙවිය යුතුව තිබූ වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් උපලේඛනය සමාලෝචිත කාල පරිච්ඡේදය අවසාන වන විට ගෙවිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි.

**2.2.2 නීති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

**------------------------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 වගන්තියට පටහැනිව, තාවකාලික වටිනාකම් හා අවිනිශ්චිතතාවයන් ආදිය සඳහා සිදු කළ ප්‍රතිපාදනයන් කොන්ත්‍රාත්වල පිරිවැයේ කොටසක් ලෙස සලකා තිබුණු අතර සියයට 30 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ඒ අනුව ගණනය කර

තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය විසින් පිරිනමන ලද කොන්ත්‍රාත් 07 ක එකතුව රු. මිලියන 1,655.27 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී වැඩිපුර ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යානය, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා මූල්‍යයනය අයවැය ගත ප්‍රතිපාදනය සහ 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුමට අනුව මූල්‍යානය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන් කිරීම | 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| චීන සංවර්ධන බැංකුව | 300.00 | 38,736.00 | 2,858.80 | 21.93 | 2,858.75 |
| ශ්‍රී.ලං.ර | 57.68 | 7,448.54 | 1,100.00 | 4.54 | 591.53 |
| | 357.68 | 46,184.54 | 3,958.80 | 26.47 | 3,450.28 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වන මාර්ග 13 ක දිග කිලෝමීටර 248.19 කින් මාර්ග 11 ක දිග කිලෝමීටර 219.94 ක ප්‍රතිසංස්කරණ වැඩ සඳහා කොන්ත්‍රාත්තු සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ පිරිනමා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

මාර්ගය දෙපස ඝන මීටර 10,412 ක අමතර හැරීම් කටයුතු හා මැණුම් පත්‍රවල සිදුකළ ගණනය කිරීම් දෝෂ හේතුවෙන් රත්නපුර -පලාවල -කරවිට මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ සිදු කිරීමේදී රු. මිලියන 16.11 ක් ව්‍යාපෘතිය අමතරව වැය කර තිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කටයුතු**

**--------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2014 සැප්තැම්බර් 09 ආරම්භ කර තිබුණද ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන තිබුණේ 2015 මාර්තු 20 වන දිනදීය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් 31 දිනට පුද්ගලයින් 106 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල තනතුරු 260 ක් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය 2015 ජූලි 20 දින ලැබී තිබුණි.

(ආ) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 යටතේ ප්‍රතිසංස්කරණය කළ බදුල්ල - මහියංගන මාර්ගය ආරම්භ කිරීමේ දැන්වීම් ගාස්තු වටිනාකම රු. මිලියන 2.14 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වන ගාල්ල - උඩුගම මාර්ගයේ පිරිවැයට ඇතුළත් කර තිබුණි.